දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2012

බ/12//02/අයවැය
මුදල් අංශය,
බන්ධනාගාර මූලස්ථානය.
2012.01.03

සියළුම කොමසාරිස්වරුන්,
සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්,
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්,

**වාර්ෂික විසර්ජන ගිණුම සකස් කිරීම - 2011**

150 වන මුදල් රෙගුලාසිය හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක 220/2011 හා 2011.11.29 වන දිනැති චක්‍රලේඛය අනුව ගණන් දීමේ නිලධාරීන් හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් 2011 වර්ෂයට අදාල විසර්ජන ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු බව මා වෙත දන්වා ඇත.

02. 2011 වර්ෂයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති පහත නම සඳහන් ආකෘති පත්‍ර හා එහි සඳහන් උපදෙස් අනුව නිවරදිව සකස් කර 2012.01.30 දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් සියළුම මාණ්ඩලික නිලධාරීන්ට කාරුණිකව දන්වමි. වාර්ෂික විසර්ජන ගිණුමේ අඩුපාඩු හෝ වැරදි දත්ත ඇතුලත් වුවහොත් විගණකාධිපතිවරයා විසින් ඒ පිළිබඳව පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීමට ඉඩ ඇති බැවින්, ඔබ ආයතනය විසින් ලබා දෙන තොරතුරු වල නිරවද්‍යතාවය ගැන ආයතන ප්‍රධානීන්ගේ පෞද්ගලික අවධානය යොමුවිය යුතු බව විශේෂයෙන් අවධාරණය කරමි.

i. බැරකම් පිළිබඳ ප්‍රකාශය.
ii. ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව.
iii. අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය.
iv. 2011 වර්ෂයේ වියදම් සාරාංශ වාර්තාව.

03. සකස් කරන ලද බැරකම් පිළිබඳ වාර්තාවේ පරිගණක පිටපතක් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත 2012.01.30 දිනට පෙර ලබා දීමට කටයුතු කළ යුතුය. බැරකම් ලේඛණයට ඇතුලත් නොකරන කිසිම බැරකමක් සඳහා 2012 වසරේ ප්‍රතිපාදනවලින් ගෙවීම නොකිරීමට බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වග බලා ගත යුතුය.

# බන්ධනාගාර ආයතනවල වියදම් විස්තර

2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

බන්ධනාගාර ආයතනය :-................................

| වැය විෂය අංකය | වැය විෂය විස්තරය | 2011 වර්ෂයේ සත්‍ය වියදම * | 2011.12.31 දිනට හිඟ බිල්පත් වටිනාකම |
|---|---|---|---|
| | **පුනරාවර්ථන වියදම** | | |
| 1001 | වැටුප් හා වේතන | | |
| 1002 | අතිකාල ගෙවීම | | |
| | නිවාඩු දින වැටුප් ගෙවීම | | |
| 1003 | ජීවන වියදම් දීමනාව | | |
| | විදුලිය දීමනාව | | |
| | ගෙවල් කුලී දීමනාව | | |
| | නිවාඩු කාලීන දුම්රිය බලපත් | | |
| | ජේලර් රාත්‍රී මුර සංචාර දීමනාව | | |
| | විනය පරීක්ෂණ දීමනා ගෙවීම. | | |
| | වෙනත් වියදම් (.................) | | |
| 1101 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා වියදම් | | |
| | රාජකාරී දුම්රිය ගමන් බලපත් වියදම | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය වියදම | | |
| 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | | |
| | දර මිලදී ගැනීම | | |
| | පර්නස් ඉන්ධන | | |
| 1203 | සලාක හා අමු ආහාර වියදම | | |
| | පිසූ ආහාර සඳහා වියදම | | |
| | නිල ඇදුම් වියදම/ මැහුම් කුලිය | | |
| 1204 | වෛද්‍ය සැපයයුම් වියදම | | |
| 1205 | සිර භාණ්ඩ මිලදී ගැනීම | | |
| | වෙනත් වියදම් (.................) | | |
| | වෙනත් වියදම් (.................) | | |
| 1301 | සුළු අළුත්වැඩියාවන් | | |
| | ටයර්/ටියුබ් සඳහා වියදම | | |
| | වාහන සේවා කිරීම | | |
| | වෙනත් වියදම් (.................) | | |
| 1302 | යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම | | |
| 1303 | ගොඩනැගිලි නඩත්තු වියදම | | |
| 1401 | ප්‍රවාහන වියදම | | |

| වැය විෂය අංකය | වැය විෂය විස්තරය | 2011 වර්ෂයේ සත්‍ය වියදම * | 2011.12.31 දිනට හිඟ බිල්පත් වටිනාකම |
|---|---|---|---|
| 1402 | තැපැල් වියදම | | |
| | දුරකථන වියදම | | |
| | අන්තර්ජාල ගාස්තු | | |
| 1403 | ජලය වියදම | | |
| | විදුලිය වියදම | | |
| | නඩත්තු ගිවිසුම් සඳහා වියදම | | |
| 1404 | වරිපනම් බදු ගෙවීම | | |
| 1405 | වෙනත් වියදම | | |
| 1506 | රාජ්‍ය සේවක දේපල ණය පොලී ගෙවීම | | |
| 1508 | වෙනත් | | |
| | **මූලධන වියදම්** | | |
| 2001 | ගොඩනැගිලි අළුත්වැඩියාව | | |
| 2002. | යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව | | |
| 2003 | වාහන අළුත්වැඩියාව | | |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | | |
| 2103 | යන්ත්‍ර සූත්‍ර උපකරණ මිලදී ගැනීම | | |
| 2104 | ගොඩනැගිලි ඉදිකිරීම | | |
| 2401 | පුහුණු වියදම | | |

* මාසික ගිණුම් සාරාංශය අනුව නිවරදි විය යුතුය.

සකස් කළේ :-

පරීක්ෂා කළේ :-

.................................

බන්ධනාගාර අධිකාරී

දිනය :-

# අස්ථානගත වවුචර පිළිබඳ ප්‍රකාශය - 2011

බන්ධනාගාර ආයතනයේ නම :-

| දිනය | වවුචර අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

<u>උපදෙස් :-</u>

01. 2011 වර්ෂයට අදාල සියළුම ගෙවීම් වවුචර කඩිනමින් විගණනයට ඉදිරිපත් කල යුතුය. කිසියම් හේතුවක් නිසා එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වවුචර තිබේ නම් ඒ පිළිබඳ විස්තර ඇතුලත් කල යුතුය.

02. අස්ථානගත වවුචර නැත්නම් හිස් වාර්තාවක් ඉදිරිපත් කල යුතුය.

# ජංගම නොවන වත්කම් පිළිබඳ වාර්තාව - 2011

බන්ධනාගාර ආයතනයේ නම :-

| වැය විෂය හා වත්කම් කාණ්ඩය | | 2011/01/01 දිනට ආරම්භක ශේෂය | 2011 වර්ෂය තුල එකතු කිරීම | 2011 වර්ෂය තුල අපහරණ | 2011/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 2101 | වාහන මිලදී ගැනීම | | | | |
| | | | | | |
| 2102 | කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ | | | | |
| | | | | | |
| 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම. | | | | |
| | | | | | |
| 2104 | නව ගොඩනැගිලි ඉදිකිරීම. | | | | |
| | | | | | |

<u>උපදෙස් :-</u>

01. 2004/01/01 දිනෙන් පසුව වැය විෂය ප්‍රතිපාදන මඟින් අත්පත් කර ගත් හෝ මිලදී ගත් වත්කම් පමණක් ඇතුලත් කල යුතුය.එනම් 2011/01/01 දිනට ආරම්භක ශේෂය ශේෂය වනුයේ 2004/01/01 දින සිට 2010/12/31 දක්වා මිලදී ගත් වත්කම්වලින් අදාල කාලය තුල අපහරණය කරන ලද වත්කම් අඩු කිරීමෙන් පසු ශේෂයයි. ස්ථාවර වත්කම් ලේඛණය අනුව නිවරදි විය යුතුය.

02. 2011 වර්ෂය තුලදී මිලදී ගත් වත්කම් ඒ ඒ වැය විෂයන් අනුව සඳහන් කල යුතුය. එම වත්කම්වල වටිනාකම් අදාල වැය විෂයේ 2011 වර්ෂය තුල කරන ලද මූළු වියදමට සමාන විය යුතුය. බන්ධනාගාර මූලස්ථානය විසින් මිලදී ගෙන බන්ධනාගාර ආයතන වෙත ලබා දුන් වත්කම් පිළිබඳ විස්තර උප බන්ධනාගාර යටතේ ඇතුලත් නොකල යුතුය.

03. 2011 වර්ෂය සඳහා අපහරණය කරන ලද විස්තර ඇතුලත් කිරීමේ දී 2004/01/01 දිනෙන් පසුව මිලදී ගත් හෝ අත්පත් කර ගත් වත්කම් වලට අදාලව අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු පමණක් ඇතුලත් කල යුතුය.

# බැරකම් පිළිබඳ ප්‍රකාශය ( 2011.12.31 දිනට නොගෙවූ හිඟ බිල්පත් විස්තර)

බන්ධනාගාර ආයතනයේ නම :-

| ණය හිමියාගේ නම * (ගෙවීම හිමියාගේ නම) | වගකීම පිළිබඳ විස්තර (සේවාව හෝ භාණ්ඩ මිලදී ගැනීම විස්තර) | අදාල වර්ෂය හා මාසය ( අදාල භාණ්ඩය හෝ සේවාව ලබා ගත් මාසය) | වැය විෂය සංකේතය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01. අමාත්‍යාංශ රජයේ දෙපාර්තමේන්තු | | | | |
| 1.......................................... | | | | |
| 2.......................................... | | | | |
| 02. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | |
| 1.......................................... | | | | |
| 2.......................................... | | | | |
| 03. පෞද්ගලික අංශය | | | | |
| 1.......................................... | | | | |
| 2.......................................... | | | | |

<u>උපදෙස් :-</u>

01. 2011 වර්ෂය තුලදී භාණ්ඩ මිලදී ගැනීම් / සේවාවන් ලබා ගැනීම් සඳහා සැපයුම්කරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, රජයේ හෝ පුද්ගලික ආයතන සඳහා ගෙවිය යුතු බිල්පත් 2011.12.31 දිනට පෙර ගෙවීමට නොහැකි වූයේ නම් එම සියළුම වියදම් 2011 වර්ෂයේ බැරකම් ලෙස ගිණුම් ගත කල යුතුය.

02. දූමරිය ,තැපල්, දේශීය ආදායම් වැනි දෙපාර්තමේන්තු හා බන්ධනාගාර කර්මාන්ත අංශයට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ඇතුලත් කල යුතුය.

03. පලාත් පාලන ආයතන, විදුලි බල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, සමුපාකාර, සතොස, රාජ්‍ය ඖෂධ සංස්ථාව ආදි ආයතනවලට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල යටතේ ඇතුලත් කල යුතුය.

04. බන්ධනාගාර නිලධාරීන්ට ගෙවීමට ඇති හිඟ වැටුප්/අතිකාල/ගමන් වියදම් වැනි බැරකම් ඇතුලත් කිරීමේදී අදාල මාසය හා වැය විෂය අනුව සාරාංශ කර පෞද්ගලික අංශය යටතේ ඉදිරිපත් කල යුතුය. (නිලධාරීන්ගේ නමින් ඉදිරිපත් නොකල යුතුය)

05. 2011 වර්ෂයට පෙර වර්ෂවල බැරකම් ඇත්නම් එම බැරකම්ද ඇතුලත් කල යුතුය.

06. අදාල බිල්පත් හා විස්තර නොපමාව ගෙන්වා ගැනීමට ආයතන ප්‍රධානීන් කටයුතු කල යුතුය.

07. මු.රෙ. 115 යටතේ අනුමැතිය ලබා ගත් හා ලබා ගැනීමට නියමිත බැරකම්ද ඇතුලත් කල යුතුය.

08. අත්තිකාරම්, පොදු තැන්පත් ගිණුම්, සුභසාධක අරමුදල් යටතේ ඇති බැරකම් ඇතුලත් නොකළ යුතුය.

09. බැරකම් විස්තරය සිංහල භාෂාවෙන් සකස් කර එහි පරිගණක පිටපතක් ලබා දිය යුතුය.

04. බන්ධනාගාර මුලස්ථානයට අදාල විස්තර ලබා දීමේ දී අදාල අංශ වෙතින් (පාලන, සැපයුම්, ඉංජිනේරු, සුභ සාධක ) තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම අදාල සියළුම මාණ්ඩලික නිලධාරීන් විසින් පියවර ගත යුතුය.

05. විසර්ජන ගිණුම සකස් කිරීම සම්බන්ධව යම් පැහැදිලි කර ගැනීමක් වෙතොත් පහත නිලධාරීන් අමතන මෙන් වැඩි දුරටත් සඳහන් කරමි.

i. ජී.එම්.කේ. බණ්ඩාර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) 0112688530
(විද්‍යුත් තැපැල - commfinance@prisons.gov.lk)
ii. එච්.සී.ඩබ්. කාරියවසම නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) 0112691904
iii. යූ.ඒ. ජයවර්ධන අයවැය සහකාර 0114677120

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත :- 01. විගණකාධිපති
02. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්